අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

**අධ්‍යයන පොදු සහතික පත්‍ර ( සාමාන්‍ය පෙළ ) විභාගය - 2024 (2025)**

**கல்விப் பொது தராதரப் பத்திர சாதாரண தரப் பரீட்சை -2024(2025)**

**General Certificate of Education (Ord. Level ) Examination -2024(2025)**

අනුහුරු ප්‍රශ්න පත්‍රය
**பயிற்சி வினாத்தாள்**
**Practice Paper**

# ඉතිහාසය

## History - வரலாறு



**Question Paper – I ,II ප්‍රශ්න පත්‍රය - I,II (සිංහල මාධ්‍යය)**

**අධ්‍යාපන අමාත්‍යංශය - ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව**
கல்வி அமைச்சு மொழிகள் மற்றும் மானுடவியல் பிரிவு
Ministry of Education – National Languages and Humanities Branch

The National e-learning Portal for the General Education

ජාතික භාෂා සහ මානව ශාස්ත්‍ර ශාඛාව

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
**Ministry of Education, Sri Lanka**

| 33 | S | I |
|---|---|---|

ඉතිහාසය I
வரலாறு I
History I

අධ්‍යයන පොදු සහතික පත්‍ර ( සාමාන්‍ය පෙළ ) විභාගය - 2024 (2025)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை
General Certificate of Education ( Ord, Level ) Examination

පැය එකයි.
ஒரு மணித்தியாலம்
One Hours

**උපදෙස්**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි** හෝ **වඩාත් සුදුසු** පිළිතුර තෝරන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ ( X ) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

1. පහත මූලාශ්‍ර අතරින් ප්‍රශස්ති කාව්‍ය ගණයට අයත් වන මූලාශ්‍රය කුමක් ද?
(1) සීතාවක හටන (2) පැරකුම්බා සිරිත (3) නිකාය සංග්‍රහය (4) රාජාවලිය

2. අග්නි හා පර්ජන්‍ය දෙවිවරුන් නිරූපණය වන මූර්තිය දැකගත හැකි ආගමික ස්ථානය කුමක් ද?
(1) අභයගිරිය (2) ජේතවනාරාමය (3) මිහින්තලේ (4) ඉසුරුමුණිය

3. අතීත ශ්‍රී ලංකාවේ පැවති පැරණි වාස්තුවිද්‍යාව පිළිබඳ තොරතුරු ලබාගැනීමේ දී වඩාත් වැදගත්වන මූලාශ්‍රය වර්ගය වන්නේ,
(1) නටබුන් ය. (2) කාසි ය. (3) අභිලේඛන ය. (4) චිත්‍ර ය.

4. **ඉන්ඩිකා** නම් විදේශීය සාහිත්‍යය මූලාශ්‍රය රචනා කරන ලද්දේ කවුරුන් ද?
(1) ඇරිස්ටෝටල් (2) ප්ලිනී (3) රිබෙයිරෝ (4) මෙගස්තිනිස්

5. තිස්සමහාරාම වැව ඉදිකරවන ලද පාලකයා කවුරුන් ද?
(1) ඉළනාග රජු (2) ධාතුසේන රජු (3) අභයනාග රජු (4) වසභ රජු

6. පහත දැක්වෙන කරුණු අතුරෙන් දුටුගැමුණු රජතුමාගේ රාජතාන්ත්‍රික බව ප්‍රකට වන අවස්ථාවක් වන්නේ,
(1) ශ්‍රී ලංකාව පළමු වරට එක්සේසත් කිරීම යි. (2) රුවන්වැලි මහා සෑය කරවීම යි.
(3) රෝහල් දහ අටක් කරවීම යි. (4) එළාරගේ සොහොනට නිසි ගෞරව දැක්වීම යි.

7. ඉන්දියාවේ චේර රාජ්‍යයේ පත්තිනි දේවාලයක් විවෘත කිරීමේ උත්සවයකට සහභාගී වූයේ ,
(1) පළමුවන ගජබාහු රජු ය. (2) භාතිකාභය රජු ය.
(3) හතරවන බුවනෙකබාහු රජු ය. (4) වසභ රජු ය.

8. පහත I තීරුවේ සෙල්ලිපි කිහිපයක් හා II තීරුවේ එම සෙල්ලිපිවල සඳහන් තොරතුරු කිහිපයක් දක්වා ඇත. I තීරුව අනුව II තීරුව ගැළපූ විට ලැබෙන නිවැරදි පිළිතුර කුමක් ද?

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. මුතුගල්ල සෙල්ලිපිය | A - තුලදර සුමන |
| 2. මණ්ඩගල සෙල්ලිපිය | B - තතවය |
| 3. වෙහෙරකෙම සෙල්ලිපිය | C - මජ්ජිම නම් කම්මල්කරු |
| | D - දටික සුමන |

(1) A, B හා C (2) A, B හා D (3) C, A හා B (4) C, B හා D

9. නැටීමේ වෘත්තියට අතීත සමාජයේ වැදගත් තැනක් හිමි වූ බව තහවුරු වන පැරණි මූලාශ්‍රය කුමක් ද?
(1) මහාවංශය (2) සමන්තපාසාදිකාව (3) මැදගම විහාර ලිපිය (4) නැට්ටුකන්ද ලිපිය

10. ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් ජනාවාසයක් වූ කිතුල්ගල බෙලි ලෙන කැනීමෙන් හමු වූ ගල් බැම්මක කොටස්වලින් තහවුරු වන්නේ,
(1) වරිච්චි නිවාස ඉදිකරගත් බව ය. (2) කෘතිම ව ගල් ගුහා තනාගෙන ජීවත් වූ බව ය
(3) පැල්පත් තනාගෙන ජීවත් වූ බව ය. (4) ජීවත්වන ස්ථානය සුදුසු පරිදි සකසා ගත් බව ය.

11. අතීත ශ්‍රී ලාංකිකයන් දිගු දුර මැනීම සඳහා භාවිත කරන ලද මිනුම් දෙකක් දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) යොදුන හා ගව්ව (2) පරමාණුව හා යොදුන (3) අණු හා තජ්ජාරි (4) ගව්ව හා තජ්ජාරි

- පහත A සිට E දක්වා ප්‍රකාශ හොඳින් කියවා 12 සහ 13 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - කොළඹ කෞතුකාගාරයේ සෙල්ලිපියක **කිරිගෙරි** යනුවෙන් සඳහන් වීම.
B - තිල සංගුලිකා නමින් හැඳින් වූ අතුරුපසක් පිළිබඳ සඳහන් වීම.
C - වීරාංකුර නමින් හැඳින්වූ පන්සලකට රන් කළං දෙසීයක් පූජා කළ බව සඳහන් වීම.
D - අතීතයේ කන්න තුනක් වී වගා කළ බව සඳහන් වීම.
E - සොරකම් කිරීම, මිනීමැරීම ආදී වරදවල් සඳහා ලබා දිය යුතු දඬුවම් පිළිබඳ සඳහන් වීම.

12. හතරවන කාශ්‍යප රජතුමා සම්බන්ධ තොරතුරු දෙකක් දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) A හා B (2) A හා C (3) B හා D (4) D හා E

13. තෝණිගල සෙල්ලිපිය සම්බන්ධ තොරතුරු දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) A හා C (2) B හා D (3) C හා D (4) D හා E

14. ඇළ මාර්ගවල මත්ස්‍යයින් ඇල්ලීම වෙනුවෙන් රජය අයකළ බදු වර්ගය වූයේ,
(1) මතරමජිබක ය. (2) බොජකපති ය. (3) කැති අඩ ය. (4) දකපති ය.

15. ඉබ්බන්කටුව පැරණි සුසාන භූමියේ තිබී හමු වූ පබළු මාලයේ සමහර පබළු ආනයනය කරන ලද රට කුමක් ද?
(1) රෝමය (2) මිසරය (3) ඉන්දියාව. (4) චීනය

16. අනුරාධපුර යුගයේ අවසාන පාලකයා කවුරුන් ද?
(1) පස්වන කාශ්‍යප (2) වසභ (3) දෙවන සේන (4) පස්වන මිහිඳු

17. ගම්පොළ රාජධානිය සම්බන්ධයෙන් **සාවද්‍ය** ප්‍රකාශය කුමක් ද?

(1) රජ පවුල හා සම්බන්ධ ප්‍රභූ පවුල් දෙකක් සිටීම (2) ඉබන්බතූතාගේ ලංකාගමනය
(3) චන්ද්‍රභානුගේ ආක්‍රමණ එල්ලවීම (4) ප්‍රාදේශීය පාලන මධ්‍යස්ථාන කිහිපයක් පැවතීම

18. පහත සඳහන් ග්‍රන්ථ අතරින් කෝට්ටේ යුගයේ දී රචිත කෘතිය කුමක් ද?

(1) සැළලිහිණි සන්දේශය (2) රසවාහිණිය
(3) සිදත් සඟරාව (4) දළදා සිරිත

19. ශ්‍රී ලංකාව පාලනය කළ රජවරුන් කිහිප දෙනෙක් I තීරුවේ ද, ඔවුන්ගේ පාලන සමයේ සිදුවූ වැදගත් සිදුවීම් කිහිපයක් II තීරුවේ ද, දක්වා ඇත. I තීරුව අනුව II තීරුව ගැළපූ විට ලැබෙන නිවැරදි පිළිතුර කුමක් ද?

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. පළමු වන විජයබාහු රජතුමා | A – වන්නි නායකයින්ගේ කැරැල්ල |
| 2. තුන්වන විජයබාහු රජතුමා | B – පාණ්ඩ්‍ය රාජ්‍ය සමඟ විවාහ සබඳතා ඇති කර ගැනීම |
| 3. හයවන භුවනෙකබාහු | C – කැලණි විහාරය ප්‍රතිසංස්කරණය කරවීම |
| | D – සිංහල සංගය නම් කැරැල්ල මර්දනය කිරීම |

(1) A, B හා D (2) A, C හා D (3) B, C හා D (4) C, A හා D

20. සීතාවක රාජසිංහ රජතුමාට උඩරට ආක්‍රමණය කිරීමට සහාය වූයේ,
(1) වීරසුන්දර බණ්ඩාර ය. (2) යමසිංහ බණ්ඩාර ය.
(3) කරලියද්දේ බණ්ඩාර ය. (4) ජයවීර බණ්ඩාර ය.

21. පෘතුගීසී කපිතාන් ජනරාල් පේරෝ ලොපෙස් ද සූසා මරණයට පත් වූ සංග්‍රාමය කුමක් ද?
(1) මුල්ලේරියාව (2) දන්තුරේ (3) බලන (4) ගන්නෝරුව

22. සෞරග්‍රහ මණ්ඩලයේ ග්‍රහලෝක සූර්යයා වටේ ඉලිප්සාකාර ව ගමන් කරන බව මුලින්ම ප්‍රකාශ කළේ කවුරුන් ද?
(1) නිකලස් කොපර්නිකස් (2) ගැලීලියෝ ගැලිලි (3) ජොහැන්ස් කෙප්ලර් (4) ජොහැන්ස් ගුටෙන්බර්ග්

- පහත A හා B ප්‍රකාශ ඇසුරෙන් 23 ප්‍රශ්නය සඳහා පිළිතුරු සපයන්න.

  A – කැලිකට් හි සැමොරින් පාලකයාගේ සහය ලබා ගැනීම
  B – තෑගි ඔප්පුවක් මගින් රාජ්‍ය උරුමය පෘතුගීසීන්ට පැවරීම

23. කෝට්ටේ ධර්මපාල රජතුමා සම්බන්ධයෙන් ,
(1) A හා B සත්‍ය වේ. (2) A හා B අසත්‍ය වේ.
(3) A සත්‍ය වන අතර B අසත්‍ය වේ. (4) A අසත්‍ය වන අතර B සත්‍ය වේ.

24. ක්‍රි.ව. 18 වන සියවස පමණ වන විට යුරෝපයේ රටවල් අතරින් වෙළෙඳ හා වාණිජ්‍ය කටයුතු වලදී ඉදිරියෙන් ම සිටි රට වූ යේ,
(1) බ්‍රිතාන්‍යය යි. (2) ප්‍රංශය යි. (3) පෘතුගාලය යි. (4) ස්පාඤ්ඤය යි.

25. පහත A සිට D දක්වා දී ඇති නිර්මාණ අතරින් කාර්මික විප්ලවය අවධියේ යකඩ හා වානේ කර්මාන්තය හා සම්බන්ධ නිර්මාණ පමණක් දැක්වෙන පිළිතුර කුමක් ද?
A. - මියුල් යන්ත්‍රය
B. - රෝලර් යන්ත්‍රය
C. - විවෘත උඳුන් ක්‍රමය
D. - වාෂ්ප එන්ජිම

(1) A හා B (2) A හා C (3) B හා C (4) C හා D

26. පෙරදිග ඉන්දියා වෙළෙඳ සමාගමට ආසියාවේ වෙළෙඳ කටයුතුවල නිරත වීමට අවසර ලබා දුන් රැජින කවුරුන් ද?
(1) පළමු වික්ටෝරියා (2) දෙවන වික්ටෝරියා (3) පළමු එළිසබත් (4) දෙවන එළිසබත්

27. ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල ක්‍රියාත්මක වූ මදුරාසි පාලනය යටතේ පාලන අධිකාරිය හා මහජනතාව අතර සබඳතාවය දුරස්වීමට බලපෑ ප්‍රධාන හේතුව කුමක් ද?

(1) උඩරට හා පහතරට වෙන වෙනම පාලනය කිරීම
(2) පාලන කටයුතු සඳහා මදුරාසියෙන් නිළධාරීන් ගෙන්වා ගැනීම
(3) බ්‍රිතාන්‍ය රජය නියෝජනය කරමින් ආණ්ඩුකාරවරයෙකු පත් කිරීම
(4) බ්‍රිතාන්‍යයන්ට විරුද්ධව මුහුදුබඩ වැසියා කැරලි ගැසීම

28. ක්‍රි.ව. 1818 උඩරට ප්‍රකාශනය සම්බන්ධව නිවැරදි ප්‍රකාශය කුමක් ද?

(1) තෝමස් මේට්ලන්ඩ් ආණ්ඩුකාරවරයා ගේ අවධියේ ප්‍රකාශ කරන ලදි
(2) මෙම ප්‍රකාශය උඩරට ගිවිසුම නමින් හැඳින් වේ
(3) උඩරට ප්‍රදේශ පාලනය සඳහා නේවාසික නිලධාරියෙකු පත් කිරීම
(4) උඩරට රදළයන්ගේ බලතල කප්පාදු කිරීම

29. ලංකාභිනව විශ්‍රැත මුද්‍රණාලය ආරම්භ කරන ලද්දේ කවුරුන් ද?

(1) මිෂනාරීන් (2) බෞද්ධයන් (3) හින්දු ආගමිකයන් (4) ඉස්ලාම් ආගමිකයන්

30. පහත සිදුවීම් හා සම්බන්ධ පුද්ගලයා කවුරුන් ද?
- ප්‍රසිද්ධ දේශන පවත්වමින් නව චින්තනයක් ඉදිරිපත් කිරීම
- මහා බෝධි සඟරාවට ලිපි සැපයීම
- බෞද්ධ පාසල් පිහිටුවීමට පුරෝගාමීව කටයුතු කිරීම

(1) හෙන්රි ස්ටීල් ඕල්කොට්තුමා (2) පියදාස සිරිසේන මහතා
(3) වලිසිංහ හරිස්චන්ද්‍ර තුමා (4) අනගාරික ධර්මපාල තුමා

31. ව්‍යවස්ථාදායක සභාවට ප්‍රථම වරට ඡන්ද බලයෙන් නියෝජිතයන් තෝරා ගැනීමට අවස්ථාව ලබාදුන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය වන්නේ,
(1) කෝල්බෲක් කැමරන් ය. (2) කෲව් මැකලම් ය.
(3) මැනිං ඩෙවොන්ෂයර් ය. (4) ඩොනමෝර් ය.

32. පහත සඳහන් ඉන්දීය නිදහස් සටනේ නායකයන් අතරින් ලංකාවට පැමිණ, ජනතාව ආමන්ත්‍රණය කළ නායකයා කවුරුන් ද?

(1) ජවහර්ලාල් නේරු (2) සුරේන්ද්‍රනාත් බැනර්ජි (3) බාල් ගංගාධාර් තිලක් (4) බිපන් චන්ද්‍රපාල්

33. අපනයනය ඉලක්ක කරගෙන ලංකාවේ මුලින්ම කුරුඳු හා ගම්මිරිස් වගා කිරීම ආරම්භ කරන ලද්දේ,
(1) ශ්‍රී ලාංකිකයන් විසිනි. (2) පෘතුගීසීන් විසිනි. (3) ලන්දේසීන් විසිනි. (4) ඉංග්‍රීසීන් විසිනි.

34. මාතලේ දිස්ත්‍රික්කයේ පමණක් සාර්ථක වීම,සෙවන ලබාදීමට අමතර වියදමක් දැරීමට සිදුවීම යන කරුණු හේතුවෙන් අසාර්ථක වූ, ඉංග්‍රීසීන් විසින් හඳුන්වා දෙන ලද බෝග වගාව කුමක් ද?
(1) සිංකෝනා (2) තේ (3) රබර් (4) කොකෝවා

35. සහල් හා ආහාර ද්‍රව්‍යවල මිල ඉහළ යාම හේතුවෙන් වාමාංශික පක්ෂ විසින් මෙහෙවන ලද හර්තාල් ව්‍යාපාරයක් නිසා ධුරයෙන් ඉල්ලා අස්වූ ශ්‍රී ලාංකික අගමැතිවරයා කවුරුන් ද?
(1) ඩී.එස්.සේනානායක මහතා (2) ඩඩ්ලි සේනානායක මහතා
(3) එස්. ඩබ්ලිව්.ආර්.ඩී බණ්ඩාරනායක මහතා (4) ජෝන් කොතලාවල මහතා

36. මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමයේ පළමු අදියර මඟින් ජලය සපයන ලද වැව කුමක් ද?
(1) පරාක්‍රම සමුද්‍රය (2) කන්තලේ වැව (3) මින්නේරිය වැව (4) නුවර වැව

37. ලංකාවේ පළමු කාර්මික ජනපදය කුමක් ද?
(1) රත්මලාන (2) ඒකල (3) කොග්ගල (4) කටුනායක

- පහත A, B,C හා D යටතේ ප්‍රකාශ යුගලය බැගින් දක්වා ඇත. මෙහි පළමු වැන්න හා දෙවැන්න අතර සම්බන්ධතාවය පරීක්ෂා කර බලා 38 සිට 40 දක්වා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A – 1. ප්‍රංශ විප්ලවය
2. බොස්ටන් තේ සාදය

B – 1. සීනි පනත
2. හොර වෙළෙඳාම නතර කිරීම

C - 1. ඉඩම්වල අයිතිය රදළයන් සතු වීම
2. වැඩවසම් සමාජ ක්‍රමය

D – 1. ලෝකයේ ආරක්ෂාව හා සාමය පවත්වා ගැනීම
2. ජාතීන්ගේ සංගමය

38. පළමුවැන්න හා දෙවැන්න අතර සම්බන්ධතාවක් **නොදැක්වෙන** යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D

39. පළමුවැන්න,දෙවැන්නේ එක් ලක්ෂණයක් බව ප්‍රකාශ කෙරෙන යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D

40. දෙවැන්න, පළමුවැන්නේ අරමුණක් වන යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D

****

ජාතික භාෂා සහ මානව ශාස්ත්‍ර ශාඛාව

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education, Sri Lanka

| 33 | S | II |
|---|---|---|

අධ්‍යයන පොදු සහතික පත්‍ර ( සාමාන්‍ය පෙළ ) විභාගය - 2024 (2025)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை
General Certificate of Education ( Ord. Level ) Examination

**ඉතිහාසය II**
வரலாறு II
History II

**පැය තුනයි**
மூன்று மணித்தியாலம்
*Three hours*

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස්:**

* I කොටසේ ප්‍රශ්න අංක 1 අනිවාර්ය වේ.
* II කොටසින් ප්‍රශ්න **හතරකට** ද, III කොටසින් ප්‍රශ්න **එකකට** ද පිළිතුරු සපයන්න.
* පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව **හයකි.**

## I කොටස

1. (අ) (i) පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන **සියල්ල ම** සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ලකුණු කර නම් කරන්න.
දැදුරුඔය , පදවිය වැව , කොත්මලේ ජලාශය, ගොඩවාය , කෝට්ටේ, සීගිරිය ,ඉබ්බන්කටුව
යාපනය, කල්පිටිය , කළුගහ , පඬුවස්නුවර , කෝණේශ්වරම් (ලකුණු12යි)

(ii) පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන **සියල්ල ම** සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ලකුණු කර නම් කරන්න.
සුමාත්‍රා, රතු මුහුද , ජිනෝවා, කැලිකට් , ස්පාඤ්ඤය , හිරෝෂිමා (ලකුණු 06යි)

(ආ) (i) පහත *A, B, C* හා *D* යටතේ දක්වා ඇති ප්‍රශ්නවලට අදාළ පිළිතුරු **අනුපිළිවෙළින්** ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.
A - බෞද්ධ රාජධානි පිළිබඳ විස්තරය නම් දේශාටන වාර්තාවේ කතුවරයා කවුරුන් ද?
B - වැලිවිට සරණංකර හිමියන්ට සංඝරාජ පදවිය පිරිනැමූ රජතුමා කවුරුන් ද?
C - කාර්මික විප්ලවය සමයේ දී බැටලු අභිජනන ක්‍රමය හඳුන්වා දුන් පුද්ගලයා කවුරුන් ද?
D - ශ්‍රී ලංකාවේ පළමු මහවැලි සංවර්ධන අමාත්‍ය වරයා කවුරුන් ද? (ලකුණු 04 යි)

* *A* සහ *B* යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට, අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු **අනුපිළිවෙළින්** ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

(ii) 1. *A* රූපයෙන් නිරූපණය වන පුද්ගලයා කවුරුන් ද?
2. එතුමා කුමන ජාතිකයෙක් ද?
3. එතුමා ජීවත් වූ රට කුමක් ද?
4. එතුමා විසින් රචිත කෘතියක් නම් නරන්න.

(ලකුණු 04 යි)



*A*


දෙවැනි පිටුව බලන්න

(iii) 1. $B$ රූපයෙන් නිරූපණය වන උපකරණය කුමක් ද?

2. එම උපකරණය සම්බන්ධ කර්මාන්තය කුමක් ද?

3. එමගින් ඉටුකරගත් කාර්යය කුමක් ද?

4. එහි නිර්මාපකයා කවුරුන් ද? (ලකුණු 04 යි)



B

## II කොටස

2. (i) ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත් වූ දකුණු අර්ධ ශුෂ්ක කලාපයට අයත් වෙරළාශ්‍රිත එළිමහන් වාසස්ථාන **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) ප්‍රාග් ඓතිහාසික මානවයාගේ අවමංගල අභිචාර විධි **දෙකක්** නම් කරන්න. (ලකුණු 04 යි)

(iii) පූර්ව ඓතිහාසික යුගයේ පැවති විධිමත් සුසාන ක්‍රම **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(iv) මුල් ඓතිහාසික යුගයේ ජනාවාසවල දැකිය හැකි ලක්ෂණ **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06 යි)

3. (i) අතීත ශ්‍රී ලංකාවේ රජවරුන් භාවිත කළ රාජ්‍යත්ව සංකල්ප **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) අතීත ජනයා වැව් පද්ධති ඉදිකිරීමට බලපෑ අරමුණු **දෙකක්** නම් කරන්න. (ලකුණු 04 යි)

(iii) වසභ රාජ්‍ය සමයේ වැදගත්කම කරුණු **දෙකක්** ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) අතීත ජනයා වාර්ගික සහජීවනයෙන් යුතුව ජීවත් වූ බව උදාහරණ **තුනක්** ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

4 . (i) ඇළහැර ඇළ මගින් පෝෂණය වන වැව් **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**A** - අතීත ශ්‍රී ලංකාවේ කිරිමඬු ශාන්තිකර්මය පැවති බවට සාධක හමුවන ප්‍රදේශය

B - දෙහිගහ ඇළකන්ද ප්‍රදේශයේ යකඩ නිස්සාරණ උඳුන් දැල්වීමට සුළං බලය ලබාගත් උපකරණය

C - මල් කැටයම් විසි එකක් සහිත රන් තැල්ලක කොටසක් හමු වූ ස්ථානය

D - පළමුවන පරාක්‍රමබාහු රජු උපන් ස්ථානය අතීතයේ දී හැඳින් වූ නම (ලකුණු 04 යි)

(iii) අතීත පාලකයන් ජනතාවගේ වෛද්‍ය පහසුකම් දියුණු කිරීමට ගත් ක්‍රියාමාර්ග **දෙකක්** පැහැදිළි කරන්න. (ලකුණු 05 යි)

(iv) පැරණි රජවරුන් නීති රීති ක්‍රියාත්මක කළ ක්ෂේත්‍ර **තුනක්** උදාහරණ ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

5. (i) ක්‍රි.ව. 1215 කාලිංග මාඝ ආක්‍රමණයෙන් පසුව බිහි වූ ස්වාධීන පාලන මධ්‍යස්ථාන **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) පොළොන්නරුව රාජධානිය බිඳවැටීමට බලපෑ හේතු **දෙකක්** නම් කරන්න. (ලකුණු 04 යි)

(iii) දෙවන පරාක්‍රමබාහු රාජ්‍ය සමයේ වැදගත්කම කරුණු **දෙකක්** ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) දෙවන නාගරීකරණ සමයේ ආර්ථික රටාවේ දැකිය හැකි ලක්ෂණ **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06 යි)

6. (i) ක්‍රි.ව. 1815 තෙක් ශ්‍රී ලංකාවේ පාලන කටයුතු මෙහෙය වූ බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරු **තිදෙනා** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) බ්‍රිතාන්‍යයන් හට ත්‍රිකුණාමලය වරාය වැදගත් වීමට බලපෑ හේතු **දෙකක්** නම් කරන්න. (ලකුණු 04 යි)

(iii) බ්‍රිතාන්‍යයන් ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශය පාලනය කළ අවස්ථා තුනෙන් **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) ක්‍රි.ව.1818 කැරැල්ල ඇතිවීමට බලපෑ හේතු **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06 යි)

7. (i) බ්‍රිතාන්‍යයන් ශ්‍රී ලංකාවට හඳුන්වාදුන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) කෝල්බෲක් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය තුළින් හඳුන්වාදුන් ප්‍රතිසංස්කරණ යෝජනා **දෙකක්** නම් කරන්න. (ලකුණු 04 යි)

(iii) ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලනය නිසා සිදු වූ සමාජ වෙනස්වීම් **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(iv) නිදහසින් පසු බිහි වූ රජයන් ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය දියුණු කිරීමට ගත් ක්‍රියාමාර්ග **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

## III කොටස

8. (i) පුනරුද සමයේ ප්‍රසිද්ධියට පත් චිත්‍ර ශිල්පීන් **තිදෙනෙකු** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) පුනරුදය ඇතිවීමට බලපෑ හේතු **දෙකක්** නම් කරන්න. (ලකුණු 04 යි)

(iii) යුරෝපා ජාතිකයන් හට නව මුහුදු මාර්ග සොයා යෑමේ ගමන සාර්ථක වීමට බලපෑ හේතු **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) පුනරුදය නිසා ශ්‍රී ලංකාවේ දේශපාලන, ආර්ථික, සමාජ හා සංස්කෘතික යන ක්ෂේත්‍රයන්හි සිදු වූ වෙනස්කම් **එක බැගින්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

9. (i) ආසියා අප්‍රිකා ප්‍රදේශවල යටත්විජිත පිහිටුවාගත් යුරෝපා රටවල් **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) පහත $A$ සිට $D$ දක්වා ප්‍රශ්නවලට පිළිතුරු වරහන තුළින් තෝරා ලියන්න.

A - සරයේවෝ නගරයේ දී මරා දමන ලද ඔස්ට්‍රියාවේ ඔටුන්න හිමි කුමරු
B - වර්සෙල්ස් ගිවිසුම මඟින් දඬුවම් පමුණුවන ලද රට
C - පළමු ලෝක මහා සංග්‍රාමයට පසුව ජර්මනියේ බලයට පත් සමූහාණ්ඩුව
D - ජර්මන් පාර්ලිමේන්තුව හැඳින්වූ නම (ලකුණු 04 යි)

( වෛමාර් , ප්‍රාන්ස් පර්ඩිනන්ඩ් , දෙවන විලියම් , ඉතාලිය , රිෂ්ටාග් , ජර්මනිය )

(iii) දෙවන ලෝක මහා සංග්‍රාමයේ ප්‍රතිඵල **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මැදිහත් වීමෙන් විසඳා ගත් අර්බුද **තුනක්** පහදන්න. (ලකුණු 06 යි)

*****

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education, Sri Lanka

33 | STE | II

අධ්‍යයන පොදු සහතික පත්‍ර ( සාමාන්‍ය පෙළ ) විභාගය - 2024 (2025)


கல்விப் பொது தராதரப் பத்திர சாதாரண தரப் பரீட்சை -2024(2025)

General Certificate of Education (Ord. Level ) Examination -2024(2025)


ඉතිහාසය II
வரலாறு II
History II

1 . (අ ) (i)
1 . ( அ) (i)
1 . (a ) (i)

විභාග අංකය
சுட்டுண்
Index No ............................



1 . (අ ) (ii)
1 . ( அ) (ii)
1 . (a ) (ii)



අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

**අධ්‍යයන පොදු සහතික පත්‍ර ( සාමාන්‍ය පෙළ ) විභාගය - 2024 (2025)**

**கல்விப் பொது தராதரப் பத்திர சாதாரண தரப் பரீட்சை -2024(2025)**

**General Certificate of Education (Ord. Level ) Examination -2024(2025)**

අනුහුරු ප්‍රශ්න පත්‍රය සඳහා පිළිතුරු පත්‍රය
**பயிற்சி வினாத்தாளுக்கான விடைப்பத்திரம**
**Answer sheet for tha Practice Paper**

# ඉතිහාසය

## History - வரலாறு



**Answer Paper – I ,II පිළිතුරු පත්‍රය - I,II (සිංහල මාධ්‍යය)**

The National e-learning Portal for the General Education

**අධ්‍යාපන අමාත්‍යාංශය - ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව**
கல்வி அமைச்சு மொழிகள் மற்றும் மானுடவியல் பிரிவு
Ministry of Education– National Languages and Humanities Branch

## අධ්‍යාපන අමාත්‍යාංශය - ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව
## අ.පො.ස. (සා.පෙළ) විභාගය 2024(2025)
### 33 ඉතිහාසය - අනුහුරු ප්‍රශ්න පත්‍රය

**I පත්‍රය - ලකුණු 1 x 40 = ලකුණු 40**

**II පත්‍රය -**

**I කොටස**

**ප්‍රශ්න අංක 1 (අනිවාර්ය ප්‍රශ්නයකි.)**

(අ) කොටස - ලකුණු 18
(ආ) කොටස - ලකුණු 12
} ලකුණු 30

**II කොටස**

ප්‍රශ්න අංක 2 - ලකුණු 18
ප්‍රශ්න අංක 3 - ලකුණු 18
ප්‍රශ්න අංක 4 - ලකුණු 18
ප්‍රශ්න අංක 5 - ලකුණු 18
ප්‍රශ්න අංක 6 - ලකුණු 18
ප්‍රශ්න අංක 7 - ලකුණු 18
} (ඕනෑම ප්‍රශ්න 4 කට)
4 × ලකුණු 18 = ලකුණු 72

**III කොටස**

ප්‍රශ්න අංක 8 - ලකුණු 18
ප්‍රශ්න අංක 9 - ලකුණු 18
} (ඕනෑම ප්‍රශ්න 1 කට)
1 x 18 ලකුණු =18

(II පත්‍රය එකතුව) **ලකුණු 120**


# පිළිතුරු පත්‍රය

## I පත්‍රය


| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|---|---|---|---|
| 01 | 2 | 11 | 1 | 21 | 2 | 31 | 2 |
| 02 | 4 | 12 | 2 | 22 | 3 | 32 | 1 |
| 03 | 1 | 13 | 2 | 23 | 4 | 33 | 3 |
| 04 | 4 | 14 | 1 | 24 | 1 | 34 | 4 |
| 05 | 1 | 15 | 3 | 25 | 3 | 35 | 2 |
| 06 | 4 | 16 | 4 | 26 | 3 | 36 | 4 |
| 07 | 1 | 17 | 3 | 27 | 2 | 37 | 2 |
| 08 | 3 | 18 | 1 | 28 | 4 | 38 | 1 |
| 09 | 3 | 19 | 3 | 29 | 2 | 39 | 3 |
| 10 | 4 | 20 | 1 | 30 | 4 | 40 | 2 |

## II පත්‍රය

(අ) (i) ලංකා සිතියම (ලකුණු12)



(ii) ලෝක සිතියම (ලකුණු 06)




## II කොටස

**(ආ) (i) පහත *A, B, C* හා *D* යටතේ දක්වා ඇති ප්‍රශ්නවලට අදාළ පිළිතුරු අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.**

***A* - බෞද්ධ රාජධානි පිළිබඳ විස්තරය නම් දේශාටන වාර්තාවේ කතුවරයා කවුරුන් ද?**
ෆාහියන් හිමි

***B* - වැලිවිට සරණංකර හිමියන්ට සංඝරාජ පදවිය පිරිනැමූ රජතුමා කවුරුන් ද?**
කිර්ති ශ්‍රී රාජසිංහ රජතුමා

***C* - කාර්මික විප්ලවය සමයේ දී බැටලු අභිජනන ක්‍රමය හඳුන්වා දුන් පුද්ගලයා කවුරුන් ද?**
රොබට් බැක්වෙල්

***D* - ශ්‍රී ලංකාවේ පළමු මහවැලි සංවර්ධන අමාත්‍ය වරයා කවුරුන් ද?** **(ලකුණු 04 යි)**
ගාමිණී දිසානායක මහතා

- ***A* සහ *B* යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට, අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.**




(ii) 1. ***A* රූපයෙන් නිරූපණය වන පුද්ගලයා කවුරුන් ද?**
ක්ලෝඩියස් ටොලමි

**2. එතුමා කුමන ජාතිකයෙක් ද?**
ග්‍රීක රෝමානුවෙක්

**3. එතුමා ජීවත් වූ රට කුමක් ද?**
ඇලෙක්සැන්ඩ්‍රියාව

**4. එතුමා විසින් රචිත කෘතියක් නම් නරන්න**
භූගෝල ශාස්ත්‍ර ප්‍රවේශය

(ලකුණු 04 යි)



(iii) **1. *B* රූපයෙන් නිරූපණය වන උපකරණය කුමක් ද?**
ජෙනී යන්ත්‍රය

**2. එම උපකරණය සම්බන්ධ කර්මාන්තය කුමක් ද?**
පේෂ කර්මාන්තය /රෙදිපිළි කර්මාන්තය

**3. එමඟින් ඉටුකරගත් කාර්යය කුමක් ද?**
කපු කැටීම/ නූල් සකස් කිරීම

**4. එහි නිර්මාපකයා කවුරුන් ද?**
ජේම්ස් හාග්‍රීව්ස්

(ලකුණු 04 යි)

## II කොටස

2. **(i) ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත් වූ දකුණු අර්ධ ශුෂ්ක කලාපයට අයත් වෙරළාශ්‍රිත එළිමහන් වාසස්ථාන තුනක් නම් කරන්න.** (ලකුණු 03 යි)
මිනිහාගල්කන්ද, බුන්දල, පතිරාජවෙල

**(ii) ප්‍රාග් ඓතිහාසික මානවයාගේ අවමංගල අභිචාර විධි දෙකක් නම් කරන්න.** (ලකුණු 04 යි)

- මළසිරුර ගල්ලෙන තුළ නවා වකුටු කර වළ දැමීම /ඇට සැකිලිවල ගුරුගල් ආලේප කිරීම.
- මළසිරුර එහි කොටස් දිරා යන තුරු යම් තැනක වළලා දමා පසුව ඇටසැකිලි ගොඩ ගෙන නැවත ඒවා තැන්පත් කිරීම
- හිස් කබලේ රළුවට පිහිටා තිබුණු දාර සහ පිටතට නෙරා තිබෙන කොටස් ගලක උලා මට්ටම් කර එක් පැත්තක රතු පැහැති ගුරුගල් ආලේප කිරීම
- හිස්කබල දෙකට බෙදෙන සේ සිදුරු විදීම

**(iii) පූර්ව ඓතිහාසික යුගයේ පැවති විධිමත් සුසාන ක්‍රම දෙකක් පැහැදිලි කරන්න.** (ලකුණු 05 යි)

- මැටි ඔරු සුසාන.
  - අමු මැටිවෙන් සකසන ලද ඔරුවක හැඩැති බේසමක හෂ්මාවශේෂ බහා ලූ මැටි වළං තැන්පත් කිරීම
  - මැටිඔරු තුළ මිනිස් ඇටසැකිලි ආදාහනය කිරීම
  - රංචාමඩම පාසල්භූමිය / බෙරගල / හල්දුම්මුල්ල

- ශිලා මංජුසා සුසාන.
  - විශාල ගල්පතුරු එක්තැන් කොට චතුරස්‍රාකාර හැඩයකට සකසා ගල් පුවරුවකින් ආවරණය කර එහි ඇතුළත මිනිස් හෂ්මාවශේෂ සහිත මැටි බඳුන් තැන්පත් කර තිබීම
  - ඉබ්බන්කටුව/ යටිගල්පොත්ත/ යාපහුව ගල් සොහොන් කනත්ත

- හරණී සුසාන
  - හෂ්මාවශේෂ සහිත කුඩා මැටි බඳුන් විශාල මැටි බඳුනක් තුළ බහා තැන්පත් කර තිබීම
  - පොම්පරිප්පු

**(iv) මුල් ඓතිහාසික යුගයේ ජනාවාසවල දැකිය හැකි ලක්ෂණ තුනක් විස්තර කරන්න.** (ලකුණු 06 යි)

- ගංගා නිම්නයට පිටතින් ප්‍රදේශවල ජනාවාස පිහිටුවා ගැනිම
  - ගංවතුර පාලනය කිරීම පිළිබඳ දැනුමක් නොමැතිවීම නිසා
- කුඩා ගම් වැවක් කේන්ද්‍ර කරගෙන පිහිටා තිබීම
  - ආහාර නිෂ්පාදනයට වර්ෂා ජලය ප්‍රමාණවත් නොවීම නිසා වර්ෂා ජලය ගබඩාකර ගැනීම සඳහා ගම් වැව් ඉදි කිරීම
  - සුමන වාපී/ විහාර වාපී /හුන්දරීවාපී /කඩහවාපී
- ගම්මාන එකිනෙක ස්වාධීනව පිහිටා තිබීම
  - පටු කැළෑ තීරයකින් වෙන් වීම
- වෘත්තීන් හා කාර්යයන් පදනම් කරගෙන බිහි වූ ගම්මාන පිහිටා තිබීම
  - කසීකාරගාම - ගොවියන් විසූ ගම්
  - මණිකාරගාම - මැණික් ගැරූ හෝ මැණික්කැපූ අය ජීවත් වූ ගම්
  - ගෝපාලගාම - ගොපල්ලන් විසූ ගම්
  - කේවට්ටගාම - ධීවරයින් විසූ ගම්
  - කුම්භකාරගාම - වළං සාදන්නන් විසූ ගම්
  - වඩ්ඪකීගාම - වඩුවන් විසූ ගම්
  - පට්ටනගාම - වරාය ආශ්‍රිත ව තිබූ ගම්
  - නියම්ගම් - වෙළෙඳ ගම්
  - ඔළගම් - ජනතාව විසින් අතහැර දැමූ වැව්ගම්

- ක්‍රමවත් පරිපාලන සැළැස්මක් පැවතීම -ගෘහපති/ ගමික / දසගම් ඇත්තන්

3. **(i) අතීත ශ්‍රී ලංකාවේ රජවරුන් භාවිත කළ රාජ්‍යත්ව සංකල්ප තුනක් නම් කරන්න.** (ලකුණු 03 යි)
- දේවත්ව/ බෝධිසත්ව /චක්‍රවර්තී / පර්වතරාජ

**(ii) අතීත ජනයා වැව් පද්ධති ඉදිකිරීමට බලපෑ අරමුණු දෙකක් නම් කරන්න.** (ලකුණු 04 යි)
- ජලය සංරක්ෂණය කර ගැනීම
  - ඉහළින් පිහිටි වැවක් ජලයෙන් පිරී ඉතිරී යන අවස්ථාවේ එම ජලය පහලින් පිහිටි වැව් වලට ගෙන යාම
- වැව් දෙකක් අතර ඇළ මාර්ගයේ නිරන්තරයෙන් ජලය ගලා යාමට සලස්වා ඇළ දෙපස භූමියේ තෙතමනය ඉහළ දැමීම යි.

**(iii) වසභ රාජ්‍ය සමයේ වැදගත්කම කරුණු දෙකක් ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි)**

- **පරිපාලනය විධිමත් කිරීම**

-රටේ අභ්‍යන්තර පාලන කටයුතු විධිමත් කිරීමට කටයුතු කිරීම. ඒ අනුව ලංකාව පළාත්වලට බෙදා (අස්ථාන) ඒවා පාලනය කිරීම සඳහා නිලධාරීන් පත් කිරීම.

උදා-

1.යාපනය(නකදිව) ප්‍රදේශය පාලනය කිරීමට ඉසිගිරි ඇමති පත් කිරීම පිළිබඳව වල්ලිපුරම් රන් පතේ සඳහන් වීම.

- **දිවයිනේ ස්ථාවර දේශපාලන බලයක් ගොඩනැගීම**

- ලම්බකර්ණ නම් නව රාජ වංශයක ආරම්භක පාලකයා වීම. මෙම පෙළපත සියවස් තුනකට වැඩි කලක් අනුරාධපුරයේ රජකමට උරුමකම් කීමට සමත්වීම.
- වසභ රජු වසර 44ක් රජ කිරීම.මෙම අවධියේ අභ්‍යන්තර අර්බුද හෝ බාහිර ආක්‍රමණ කිසිවක් නොවීම
- රජුගේ බලය දිවයින පුරාම පැවැති බව,මෙතුමා පිහිට වූ සෙල්ලිපි දිවයින පුරාම හමුවීමෙන් පැහැදිලි වේ.

- **ආර්ථික වැදගත්කම**

- මහවැව් ඉදිකිරීමේ ආරම්භක පාලකයා වීම.
- මහවැව් 11ක් හා ඇළවල් 12ක් ඉදිකළ බව මූලාශ්‍රවල සඳහන් වේ.
  (මහවිලච්චිය වැව ,මානාකැටිය වැව,නොච්චිපොතාන වැව ,ඇළහැර ඇළ)
- දකුණු ඉන්දියාවේ ක්‍රිෂ්ණා ගංගා නිම්නයේ ඇති වූ ආහාර හිඟයක් හේතුවෙන් මෙරට නිපද වූ ධාන්‍ය සඳහා විශාල ඉල්ලුමක් ඇති වූ නිසා ඒ සඳහා මුහුණ දීමට ද මෙරට කෘෂිකර්මාන්තය දියුණු කළ බව
- රජයේ බදු අයකිරීම වඩාත් විධිමත් කිරීම.

- **ආගමික අනුග්‍රහය**

- වෙහෙර විහාර ඉදිකිරීම /අලුත් වැඩියා කිරීම.
- විහාරස්ථාන සඳහා ගම්බිම් පූජා කිරීම.

**(iv) අතීත ජනයා වාර්ගික සහජීවනයෙන් යුතුව ජීවත් වූ බව උදාහරණ තුනක් ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)**

- අතීතයේ පැරණි නගරවල විවිධ සංස්කෘතීන්ට අයත් ජනතාව වාසය කළ බවට සාක්ෂි හමු වීම.
- දකුණු ඉන්දියාවෙන් මෙහි පැමිණි දෙමළ වෙළෙන්දෝ, ග්‍රීක් සහ මැසිඩෝනියන් ප්‍රදේශවලින් පැමිණි අයෝනියන්වරු, ඇෆ්ඝනිස්ථාන් ප්‍රදේශයෙන් පැමිණි කාම්බෝජවරු,මලයානු අර්ධද්වීපයෙන් පැමිණි ජාවකවරු
- ජාතීන් අතර කොපමණ විවිධත්වයක් පැවතිය ද කවර අවස්ථාවකදීවත් ඔවුන් එකිනෙකා සමග කෝලාහල කර ගැනීමට උත්සාහ දරා නැති බව
- බුද්ධශාසනයේ පැවිදි ව සිටි දෙමළ ජාතික භික්ෂූන් වහන්සේ කෙනෙකු ගැන අනුරාධපුරයේ අභයගිරි විහාරයෙන් සොයා ගන්නා ලද සෙල්ලිපියක සඳහන් වීම.
- අන්‍ය ජාතීන් දෙස සැක මුසු ලෙස දකින්නට පුරාණ කාලයේ මෙරට වැසියන් පුරුදු වී සිටියේ නැති බව හා අන්‍ය ජාතීන් සමග සුහද ලෙස ජීවත් වීමට ඔවුහු කටයුතු කළ බව.
- පළමුවන විජයබාහු රජතුමා පොළොන්නරුව දළදා මාළිගයේ ආරක්ෂාව වේලෛක්කාර හමුදාවට බාර දීම
- දෙමළ ජාතික පුරුෂයෙකු සමඟ විවාහ වූ සිංහල කාන්තාවක ගැන අම්පාර දිස්ත්‍රික්කයෙන් සොයා ගන්නා ලද ඉතා පැරණි සෙල්ලිපියක සඳහන්ව තිබීම.
- මෙරට රාජසභාවේ 'දෙමළ අධිකාරී' නමින් හැඳින්වූ විශේෂ තනතුරක් තිබිණි. ඔහුගේ කාර්යය වූයේ අනුරාධපුරය සහ ඒ අවට වාසය කළ දෙමළ ජනයාගේ ශුභසාධන කටයුතු සොයා බැලීම විය යුතු බව.
- ශ්‍රී පාදය මෙරට බෞද්ධ වැසියන්ගේ හා මුස්ලිම් බැතිමතුන්ගේ ද වන්දනාවට ලක් වූ බව ('ආදම්ගේ කන්ද')
- දේශ ගවේෂකයකු මෙන් ම වෙළෙන්දෙකු වූ සුලෙයිමාන් ශ්‍රී පාදය වන්දනා කිරීමට පැමිණීම

**4. (i) ඇළහැර ඇළ මඟින් පෝෂණයවන වැව් තුනක් නම් කරන්න. (ලකුණු 03 යි)**

- මින්නේරිය/ ගිරිතලේ/ කවුඩුල්ල / කන්තලේ

**(ii) පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

**A - අතීත ශ්‍රී ලංකාවේ කිරිමඩු ශාන්තිකර්මය පැවති බවට සාධක හමුවන ප්‍රදේශය**

- රත්නපුරය ගල්පාය

**B - දෙහිගහ ඇළකන්ද ප්‍රදේශයේ යකඩ නිස්සාරණ උදුන් දැල්වීමට සුළං බලය ලබාගත් උපකරණය**

මයිනහම

**C - මල් කැටයම් විසි එකක් සහිත රන් තැල්ලක කොටසක් හමු වූ ස්ථානය**

- අනුරාධපුර ජේතවනාරාම විහාරය

**D -** **පළමුවන පරාක්‍රමබාහු රජු උපන් ප්‍රදේශය අතීතයේ දී හැඳින් වූ නම** **(ලකුණු 04 යි)**

- පුංඛ ග්‍රාමය

**(iii) අතීත පාලකයන් ජනතාවගේ වෛද්‍ය පහසුකම් දියුණු කිරීමට ගත් ක්‍රියාමාර්ග දෙකක් පැහැදිළි කරන්න.** **(ලකුණු 05 යි)**

- **රෝහල් ඉදිකිරිම**

-පණ්ඩුකාභය රාජ්‍ය සමයේ සිවිකාශාලා ගැන සඳහන් වීම,දුටුගැමුණු රජු රෝහල් 18ක් ඉදිකිරීම

-උපසග්ගරෝගනාස - iv කාශ්‍යප රජු

-පසවන්තිනාමශාලා -I උපතිස්ස රජු

-ආලාහන පිරිවෙන් රෝහල -මහා පරාක්‍රම බාහු රජු

- **පුරාවිද්‍යාත්මක තොරතුරු හමුවීම**

- පැරණි රෝහල් පිළිබඳව නටබුන් හමු වීම

උදා-මිහින්තලා රෝහල,පොළොන්නරුව ආලාහන පිරිවෙන් රෝහල,මාලිගාවිල ඇස් රෝහල,මැදිරිගිරිය රෝහල

- සැත්කම් උපකරණ හමුවීම (ආලාහන පිරිවෙනෙහි සැත්කම් උපකරණ)
- බෙහෙත් ඔරු හා ඇඹරුම්ගල්

- **වෛද්‍යවරු පත්කිරීම,වෙද පොත්,ගම්බිම් පිදීම**

-මහවෙදනා,වෙදනා ආදී තනතුරු පිළිබඳව සඳහන් වීම

-බුද්ධදාස රජු විසින් සෑම ගම් දහයකටම වෛද්‍යවරයෙක් බැගින් පත් කිරීම

රජු ද වෛද්‍යවරයෙක් වීම

-බුද්ධදාස රජු සාරාර්ථ සංග්‍රහය නම් වෛද්‍ය ග්‍රන්ථයක් රචනා කිරීම

-වෛද්‍යවරුන් සඳහා ගමබිම් වෙන් කිරීම

-ඔසු උයන් පිළිබඳව තොරතුරු හමුවීම

- **රජවරු රෝහල් නඩත්තුවට අවශ්‍ය ද්‍රව්‍ය ලබා දීම**

උදා-පස්වන මිහිඳු රජු ලංකාවේ නොයෙක් පළාත්වල පිහිටුවා තිබූ රෝහල්වලට අවශ්‍ය ද්‍රව්‍ය ලබා දීම.

**(iv) පැරණි රජවරුන් නීති රීති ක්‍රියාත්මක කළ ක්ෂේත්‍ර තුනක් උදාහරණ ඇසුරෙන් විස්තර කරන්න** **(ලකුණු 06 යි)**

- **පරිසරය ආරක්ෂා කිරීමට (පස/ ජලය/ගස් කොළන්/සතුන්)**

- කොණ්ඩවට්ටවාන් ටැම් ලිපිය - නිසි කාලයට සී සෑම නොකරන පුද්ගලයින්ට කළං පහක දඩයක් නියම කිරීම
- අනුරාධපුර වෙස්සගිරියේ සෙල්ලිපියක - වැව්වලින් ගොවිතැන් කරන කුඹුරුවල සිහිනැටි වී මිස, මුං ඇට වැපිරීම නොකළ යුතු බව ( හතර වන මහින්ද රජතුමා)
- අමණ්ඩ ගාමිණී අභය රජු- 'මාඝාත නීතිය'
- නිශ්ශංකමල්ල රජු - ජලාශවල ජීවත් වන පක්ෂීන් මැරීම තහනම් කිරීම.
- හතර වන මිහිඳු රජු - මිහින්තලා පුවරු ලිපිය - මී හරකුන්, එළ හරකුන් සහ එළුවන් ඝාතනය කරන්නන්ට මරණ දඬුවම පැනවීම.
- අනුරාධපුර පුවරු ලිපිය - උස් ගොඩබිම් ඉඩම්වල කැලෑ නොකැපිය යුතු බව
- බුද්ධන්නෙහෙල -සෙල්ලිපිය - වල් වල දඹුපත් නොකපනු ඉසා'

- **බදු නීතිය**

- වැව් පරිපාලනය සහ රජයේ ඉඩම් පරිහරණය කිරීමට සම්බන්ධ බදු ( දකපති/ බොජකපති/ මතරමජිබක )
- ගොඩවාය ලිපිය -වරාය තීරුබදු

- **වෙළෙඳපොළ පාලනය - හෝපිටිගම ලිපිය( හතරවන උදය රජතුමා)**

- හෝපිටිගම වෙළෙඳපළ සීමාවේ වෙළෙඳාම් කරන අයගෙන් පමණක් බදු අය කළ යුතු වන අතර වෙළෙඳපළ පසුකොට යන්නවුන්ගෙන් බදු අය නොකළ යුතු බව
- නිලධාරීන්ට නොපෙන්වා එම වෙළෙඳපළේ භාණ්ඩ විකුණන අයගෙන් දෙගුණයක් බදු අයකළ යුතු බව
- රජයේ නිලධාරීන් විසින් ප්‍රමිතිගත නොකරනලද මදටිය බර (තරාදි පඩි) යොදා වෙළෙඳාම් නොකළ යුතු බව
- බුලත් සහ පුවක් විකිණීම ඒ සඳහා සකස් කරන ලද මඩුවල පමණක් තබා වෙළෙඳාම් කළ යුතු ය
- පොහොය දිනවල වෙළෙඳාම් කළ අයගෙන් දඩයක් වශයෙන් තෙල් බද්දක් ලබා ගත යුතු බව

- **අපරාධ නීතිය - වේවැල්කැටිය ලිපිය**

- හතර වන මිහිඳු රජු - මිහින්තලා පුවරු ලිපියේ - මී හරකුන්, එළ හරකුන් සහ එ`එවන් ඝාතනය කරන්නන්ට මරණ දඬුවම පැනවීම

- **විහාර ආරාම පාලනය -මිහින්තලා පුවරු ලිපිය**

උදාහරණ ඇසුරෙන් විස්තර කර තිබීම

**5. (i) ක්‍රි.ව. 1215 කාලිංග මාඝ ආක්‍රමණයෙන් පසුව බිහි වූ ස්වාධීන පාලන මධ්‍යස්ථාන තුනක් නම් කරන්න.** **(ලකුණු 03 යි)**

සුභ පබ්බත/ මිණිපේ ගංදෙණිය/ ගෝවින්දමලය/දඹදෙණිය

**(ii) පොළොන්නරු රාජධානිය බිඳවැටීමට බලපෑ හේතු දෙකක් නම් කරන්න.** **(ලකුණු 04 යි)**

- දුර්වල පාලකයන් බලයට පත්වීම
- රාජ වංශ අතර ඇති වූ බල අරගල
- ආර්ථික පරිහානිය
- කාලිංග මාඝ ආක්‍රමණය. යන කරුණු අතරින් දෙකක්

**(iii) දෙවන පරාක්‍රමබාහු රාජ්‍ය සමයේ වැදගත්කම කරුණු දෙකක් ඇසුරෙන් විස්තර කරන්න.** **(ලකුණු 05 යි)**

- කාලිංග මාඝ පළවා හැර රජරට ප්‍රදේශය නිදහස් කරගැනීම
- ජාවක චන්ද්‍රභානුගේ ආක්‍රමණ දෙකක් මර්දනය කිරීම
- පොතපත ලිවීම හා ඒ සඳහා රාජ්‍ය අනුග්‍රහය ලබා දීම (කව්සිළුමිණ/සද්ධර්මරත්නාවලිය/පූජාවලිය වැනි...)
- දේව පතිරාජ නම් ඇමතිවරයා යොදවා ආර්ථික, ආගමික හා අධ්‍යාපනික අංශවල ද ප්‍රබල දියුණුවක් ඇති කිරීම
- ආගමික අනුග්‍රහය හා දඹදෙණියේ දළදා මැදුර ඉදිකරවීම

**(iv) දෙවන නාගරීකරණ සමයේ ආර්ථික රටාවේ දැකිය හැකි ලක්ෂණ තුනක් විස්තර කරන්න** **(ලකුණු 06 යි)**

- ප්‍රධාන ජීවනෝපාය කෘෂිකර්මාන්තය වීම

- ප්‍රධාන වගාව වී ගොවිතැන ,ජල හිඟ පෙදෙස්වල හේන් ගොවිතැන
- කෘෂි කටයුතු සඳහා අහස් දිය යොදා ගැනීම

- වාණිජ ආර්ථික රටාවකට යොමු වීම

- ආහාර භෝග අතිරික්තය වෙළෙඳාමට යොමු කිරීමත් සමග වාණිජ ආර්ථික රටාවකට යොමු වීම

- දේශීය හා විදේශීය වෙළෙඳාම වර්ධනය වීම

- තෙත් කලාපයේ වනගතව වැවුණු කුරුඳු මෙකල වැදගත් වෙළෙඳ භෝගයක් වීම
- සංවිධානාත්මක අභ්‍යන්තර වෙළෙඳාම
- අභ්‍යන්තර වෙළෙඳාම සම්බන්ධ කඩ වීදි තිබූ බව කුරුණෑගල විස්තරය නම් කෘතියේ සඳහන් වේ.
- ඉන්දියාව ,ආරාබිය,චීනය,පර්සියාව හා ඊජිප්තුව ආදී රටවල් සමග වෙළෙඳ සම්බන්ධතා පැවැත්වීම ලංකාවේ බටහිර වෙරළබඩ නැව් තොටු ආශ්‍රිතව සරුසාර වෙළෙඳාමක් පැවැති බව, ඉබන් බතූතාගේ වාර්තාවේ සඳහන් වීම.

- අපනයන භෝග හා අපනයන ද්‍රව්‍ය

- තෙත් කලාපයේ වනගතව වැවුණු කුරුඳු මෙකල වැදගත් අපනයන ද්‍රව්‍යයක් වීම
- පුවක්,ගම්මිරිස්,එනසාල්,සාදික්කා වැනි භෝගවල අතිරික්තය ද අපනයනය කිරීම
- මුතු,මැණික්,ඇතුන්, හා ඇත් දළ වැනි වෙළෙඳ භාණ්ඩ ද අපනයනය කිරීම
- විදේශ වෙළෙඳාම රජුගේ ඒකාධිකාරය යටතේ පැවතීම.

**6. (i) ක්‍රි.ව. 1815 තෙක් ලංකාවේ පාලන කටයුතු මෙහෙය වූ බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරු තිදෙනා නම් කරන්න.**

- පෙඩ්රික් නෝර්ත්/තෝමස් මේට්ලන්ට්/රොබට් බ්‍රවුන්රිග් **(ලකුණු 03 යි)**

**(ii) බ්‍රිතාන්‍යයන්ට ත්‍රිකුණාමලය වරාය වැදගත් වීමට බලපෑ හේතු දෙකක් නම් කරන්න.** **(ලකුණු 04 යි)**

- ත්‍රිකුණාමල වරාය බෙංගාල බොක්කට මුහුණ ලා පිහිටා තිබීම

- ශ්‍රී ලංකාව ඉන්දියාව ආසන්නයේ පිහිටා තිබීමත්
- බෙංගාල බොක්ක ඇතුළු ඉන්දියාව අවට මුහුදු කලාපයේ නාවික හා වෙළෙඳ කටයුතු පාලනයට ලංකාව හොඳ මධ්‍යස්ථානයක් වීමත්

- ඉන්දියාවේ නැගෙනහිර වෙරළේ ඉංග්‍රීසී නාවික බලය රැක ගැනීමට

- ඉංග්‍රීසීන් හා ප්‍රංශවරුන් අතර බෙංගාල බොක්ක ආශ්‍රිත ප්‍රදේශවල සටන් ඇති වූ අවස්ථාවල සතුරු ප්‍රහාර නිසා අබලන් වූ නැව් අලුත්වැඩියා කිරීමට සුදුසු වරායක අවශ්‍යතාව

- එම වරායේ පිහිටීම වැදගත් වීම
- ඊසාන දිග මෝසම් සුළං කාලයේ නැව් ආරක්ෂා කර ගැනීමට ත්‍රිකුණාමල වරාය යොදා ගත හැකි වීම

**(iii) බ්‍රිතාන්‍යයන් ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශය පාලනය කළ අවස්ථා තුනෙන් දෙකක් විස්තර කරන්න.** **(ලකුණු 05 යි)**

- **මදුරාසි පාලනය/ වෙළෙඳ සමාගමේ පාලනය**
  - විදේශීය නිලධාරීන් ගෙන්වා ගැනීම/ රෙසිඩන්ට්/අවුමිල්දාර්/ කලෙක්ටර්
  - ජනතාව හා පාලන අධිකාරිය අතර දුරස් බවක් ඇති වීම
  - 1797-98 වෙරළ බඩ වැසියා බ්‍රිතාන්‍ය පාලනයට විරුද්ධව කැරලි ගැසීම
- **ද්විත්ව පාලනය**
  - ආණ්ඩුකාරවරයා හා වෙළෙඳ සමාගම එක්ව පාලනය කිරීම
- **කිරීටයේ පාලනය-** බ්‍රිතාන්‍යය යටත් විජිතයක් බවට පත්වීම

**(iv) ක්‍රි.ව.1818 කැරැල්ල ඇතිවීමට බලපෑ හේතු තුනක් විස්තර කරන්න.** **(ලකුණු 06 යි)**

- **නිදහස අහිමිවීම හා රජෙකු නැතිවීම පිළිබඳ පසුතැවිල්ල**
  - උඩරටියන්ට අවශ්‍ය වූයේ, සැතපුම් දහස් ගණනක් ඈත රටක සිටින කිසි දින නො දුටු රජෙකු නො ව තම අගනුවර වෙසෙන තමන්ගේ දුක් ගැනවිල්ලක් ඉදිරිපත් කොට සහනයක් ලබා ගත හැකි රජෙක් වීම.
  - තමන්ට පෙනෙන ස්ථානයක රජෙකු නැති නිසා තමන් අරාජික යැයි උඩරටියන් තුළ හැඟීමක් ඇතිවීම
- **ආගම හා සංස්කෘතියේ ආරක්ෂාව පිළිබඳ ගැටලු මතු වීම**
  - විදේශිකයන් යටතේ තම සම්ප්‍රදායන් හා සංස්කෘතිය විනාශ වෙතැයි ද උඩරටියන් තුළ බියක් ඇතිවීම. සාම්ප්‍රදායික පාලනය යටතේ පෙර සිරිත ආරක්ෂා කිරීම රජෙකුගේ ප්‍රධාන යුතුකමක් වීම එසේ ම රජ මාලිගාව, රාජ සභාව හා පරිපාලන කටයුතු ආශ්‍රිතව සම්ප්‍රදායන් රැසක් පැවතීම, එම සම්ප්‍රදායන් බිඳ වැටෙතැයි ඇති වූ සැකය.

- **උඩරට ප්‍රභූ පන්තියට පහර වැදීම**
  - රදලයන්ගේ සාම්ප්‍රදායික ආදායම් මාර්ගවලට ද එම පාලනය නිසා පහර වැදීම
  - ඉංග්‍රීසීන් කඩවත් බදු අහෝසි කිරීම නිසා රදලයන්ට එමගින් ලැබුණු ආදායම අහිමි වීම
  - රදලයන්ට පාරම්පරිකව හිමි වූ නිල තල වෙනස් කිරීම
  - උඩරට ප්‍රවාහන කටයුතු භාර වූ මඩිගේ මුහන්දිරම් තනතුරට මුස්ලිම් ජාතිකයෙකු පත් කිරීම

**7. (i) බ්‍රි තාන්‍යයන් ශ්‍රී ලංකාවට හඳුන්වාදුන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ තුනක් නම් කරන්න.** **(ලකුණු 03 යි)**

- කෝල්බෲක් කැමරන්/ කෲව් මැකලම්/ මැනිං/මැනිං-ඩෙවොන්ෂයර්/ඩොනමෝර්/සෝල්බරි

**(ii) කෝල්බෲක් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය තුළින් හඳුන්වාදුන් ප්‍රතිසංස්කරණ යෝජනා දෙකක් නම් කරන්න.** **(ලකුණු 04 යි)**

- ව්‍යවස්ථාදායක හා විධායක සභා පිහිටුවීම.
- උඩරට හා පහතරට පළාත් සඳහා ඒකාබද්ධ වූ පාලන ක්‍රමයක් හඳුන්වා දීම.
- දිවයින පළාත් පහකට බෙදීම.
- අනිවාර්ය සේවා රාජකාරි ක්‍රමය අහෝසි කිරීම.
- රජයේ වෙළෙඳ ඒකාධිකාරය අහෝසි කිරීම.

**(iii) ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලනය නිසා සිදු වූ සමාජ වෙනස්වීම් දෙකක් පැහැදිලි කරන්න.** **(ලකුණු 05 යි)**

- **පැරණි ප්‍රභූ පන්තිය අභාවයට ගොස් නව මධ්‍යම පන්තියක් බිහිවීම**
  - පැරණි ප්‍රභූ පන්තිය යනු ආර්ථික තත්ත්වය, සමාජ තත්ත්වය හා දේශපාලන බලය අතින් සෙසුජනතාවට වඩා විශේෂයෙන් කැපීපෙනුණු පිරිසක් වීම.
  - ඔවුන්ට ඉඩම් හිමිකමක් තිබූ ඔවුහු ඉහළ ආදායමක් ලැබූ අතර පවත්නා පාලනයට පක්ෂපාතීව කටයුතු කිරීමෙන් රජයේ නිල තල දැරූ පිරිසක් වීම
- **ධනවාදී ආර්ථික ක්‍රමයකට පදනම සැකසීම**
  - සාම්ප්‍රදායික ධනෝපායන මාර්ග වෙනුවට ධනය උපයාගත හැකි අලුත් මාර්ග රැසක් විවෘත වීම ධනවත් පන්තියක් බිහිවීම
- නීතිඥ වෛද්‍ය, ඉංජිනේරු,මිනින්දෝරු, ලිපිකාර, සිවිල් සේවය වැනි අලුත් රැකියා අවස්ථා ජනිත වීම
- නව මධ්‍යම පන්තියක් බිහිවීම

- කම්කරු පන්තියක් බිහි වීම
- සංස්කෘතික වෙනස්වීම්

**(iv) නිදහසින් පසු බිහි වූ රජයන් ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය දියුණු කිරීමට ගත් ක්‍රියාමාර්ග තුනක් පැහැදිලි කරන්න.** **(ලකුණු 06 යි)**

- ගොවි ජනපද පිහිටුවීම
- මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමය
- වී පර්යේෂණ ආයතන පිහිටුවීම හා නව වී ප්‍රභේද හඳුන්වා දීම
  උදා -බතලගොඩ වී අභිජනන මධ්‍යස්ථානය
- ගොවිජන සේවා මධ්‍යස්ථාන පිහිටුවීම
- රජයේ බැංකු මගින් ගොවියන්ට ණය ආධාර ලබාදීමට පියවර ගැනීම

## III කොටස

**8. (i) පුනරුද සමයේ ප්‍රසිද්ධියට පත් චිත්‍ර ශිල්පීන් තිදෙනෙකු නම් කරන්න** **(ලකුණු 03 යි)**

- ලියනාඩෝ ඩාවින්චි, මයිකල් ආන්ජලෝ, මැසෙක්ෂියෝ, බොට්ටි චෙල්ලි, රෆායල්

**(ii) පුනරුදය ඇතිවීමට බලපෑ හේතු දෙකක් නම් කරන්න.** **(ලකුණු 04 යි)**

- කොන්ස්තන්තිනෝපලය තුර්කි ජාතිකයින් යටත් කරගැනීම.
- වෙළදාමේ දියුණුව හා නව ධනවතුන් පිරිසක් බිහි වීම.
- බුද්ධි ප්‍රබෝධය
- පල්ලියේ ආධිපත්‍ය විවේචනය කිරීම

**(iii) යුරෝපා ජාතිකයන් හට නව මුහුදු මාර්ග සොයා යෑමේ ගමන සාර්ථක වීමට බලපෑ හේතු දෙකක් විස්තර කරන්න** **(ලකුණු 05 යි)**

- **නව විද්‍යාත්මක සොයාගැනීම්**
- නාවික ගමන් සුරක්ෂිතව යාමට හැකි මාලිමා යන්ත්‍රය, උතුරු තරු මාපකය වැනි උපකරණ සොයාගැනීම.
- ලෝකය ගෝලාකාර බව තහවුරු කරගැනීම.
- ටොලමිගේ ලෝක සිතියම
- **ජාතික රාජ්‍යන්වල අනුග්‍රහය**
- පෘතුගාලයේ නාවික හෙන්රි නාවික විද්‍යාලයක් පිහිටුවීම.
- ස්පාඤ්ඤයේ පර්ඩිනන්ඩ් හා ඉසෙබෙලා රැජින අනුග්‍රහය දැක්වීම.

**(iv) පුනරුදය නිසා ශ්‍රී ලංකාවේ දේශපාලන, ආර්ථික, සමාජ හා සංස්කෘතික යන ක්ෂේත්‍රයන්හි සිදු වූ වෙනස්කම් එක බැගින් පැහැදිලි කරන්න.** **(ලකුණු 05 යි)**

- **දේශපාලන**
- රාජාණ්ඩු පාලනය බිඳ වැටීම හා පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයක් ස්ථාපිත වීම.
- පැරණි දේශීය නිලධාරී පැලැන්තිය අභාවයට යාම
- පැරණි නීති පද්ධතිය අභාවයට යාම හා රෝම ලන්දේසි නීතිය හඳුන්වා දීම
- නව අධිකරණ පද්ධතියක් හඳුන්වා දීම.
- **ආර්ථික**
- ග්‍රාමීය ස්වයංපෝෂිත ආර්ථිකය බිදවැටී ආනයන අපනයන ආර්ථිකයක් නිර්මාණය වීම.
- බැංකු පද්ධතියක් බිහිවීම හා මුදල් භාවිතය ප්‍රචලිත වීම.
- වෙළෙඳ නගර බිහිවීම (කොළඹ ,ගාල්ල ,ත්‍රිකුණාමලය)
- මාහාමාර්ග හා දුම්රිය මාර්ග පද්ධතියක් ගොඩනැගීම.
- **සමාජ හා සංස්කෘතික**
- බටහිර චින්තනය හා බටහිර සංස්කෘතිකාංග මෙරට ප්‍රචලිත වීම.
- බටහිර අධ්‍යාපන ක්‍රමය ප්‍රචලිත වීම වීම.
- යුරෝපීයන්ගේ ආගම් මෙරට ප්‍රචලිත වීම

[ Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers! ]

**9. (i) ආසියා අප්‍රිකා ප්‍රදේශවල යටත්විජිත පිහිටුවාගත් යුරෝපා රටවල් තුනක් නම් කරන්න. (ලකුණු 03 යි)**

- බ්‍රිතාන්‍යය ,පෘතුගාලය ,ප්‍රංශය ,ස්පාඤ්ඤය,බෙල්ජියම ,ඕලන්දය

**(ii) පහත *A* සිට *D* දක්වා ප්‍රශ්නවලට පිළිතුරු වරහන තුළින් තෝරා ලියන්න.**

**A - සරයෙවෝ නගරයේ දී මරා දමන ලද ඔස්ට්‍රියාවේ ඔටුන්න හිමි කුමරු**
ප්‍රාන්ස් ෆර්ඩිනන්ඩ්

**B - වර්සෙල්ස් ගිවිසුම මඟින් දඬුවම් පමුණුවන ලද රට**
ජර්මනිය

**C - පළමු ලෝක මහා සංග්‍රාමයට පසුව ජර්මනියේ බලට පත් සමූහාණ්ඩුව**
වෛමාර්

**D - ජර්මන් පාර්ලිමේන්තුව හැඳින් වූ නම (ලකුණු 04 යි)**
රිෂ්ටාග්

**(iii) දෙවන ලෝක මහා සංග්‍රාමයේ ප්‍රතිඵල දෙකක් විස්තර කරන්න. (ලකුණු 05 යි)**

- අක්ෂ බලවතුන් පරාජයට පත්වීම.
- විශාල ජීවිත හා දේපළ සංඛ්‍යාවක් විනාශ වීම.
- ලෝක බලවතුන් ලෙස සිටි ප්‍රංශයට හා බ්‍රිතාන්‍යට එම ස්ථාන අහිමි වී යාම.
- ඇමරිකාව හා රුසියාව ලෝක බලවතුන් ලෙස නැගී සිටීම හා එම රටවල් දෙක කේන්ද්‍ර කරගනිමින් බල නව බල කඳවුරු දෙකක් නිර්මාණය වීම.
- විනාශයට පත් වූ යුරෝපයේ පරාජිත රටවල් නගා සිටුවීමට මාර්ෂල් සැලැස්ම හඳුන්වා දීම.
- ආසියා අප්‍රිකා රටවල්වල යටත් විජිත ඉන් මිදී නිදහස ලැබීම.
- එක්සත් ජාතීන්ගේ සංගමය බිහි වීම.

**(iv) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මැදිහත් වීමෙන් විසඳාගත් අර්බුධ තුනක් පහදන්න (ලකුණු 06 යි)**

- සුවස් අර්බුදය
- ගල්ෆ් අර්බුදය
- කියුබානු මිසයිල අර්බුදය

PAST PAPERS WIKI

WWW.PastPapers.WiKi

[ Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers! ]